## සිතියම් අංක 15: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්වභාවික වෘක්ෂලතා


2017 යාවත්කාලීන කරන ලද ඉඩම් පරිහරණ සිතියමට අනුව කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ස්වභාවික වෘක්ෂලතා වල ව්‍යාප්තිය පහත සිතියම් අංක 15 මගින් පෙන්වා දී ඇත. එය මුළු භූමිය හා සසඳන කළ ඉතා සුළු බිම් ප්‍රමාණයක් වන අතර මුළු බිමෙන් 14% ක පමණ ප්‍රතිශතයකි.

එම සිතියමට අනුව කොට්ඨාසයේ වාර්තා වන වනාන්තර දත්ත පහත වගු අංක 09 මගින් මෙන්ම ප්‍රස්ථාර අංක 07 මගින් පෙන්වා දී ඇත.

**වගු අංක 09 2017, යාවත්කාලීන දත්තයන්ට අනුව වනාන්තර ව්‍යාප්ති තොරතුරු**

| වනාන්තර | මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ඝන වනාන්තර | 1809.76 | 75 |
| විවෘත වනාන්තර | 254.11 | 10 |
| වන වගා | 38.45 | 2 |
| ලඳු කැලෑ | 310.1 | 13 |
| **එකතුව** | **2412.42** | **100** |


**ප්‍රස්ථාර අංක 07** **2017, යාවත්කාලීන දත්තයන්ට අනුව වනාන්තර ව්‍යාප්ති තොරතුරු**





- සිතියමෙහි ඝන වනාන්තර වශයෙන් දක්වා ඇත්තේ වෘක්ෂලතා ආවරණය 75 % කට වැඩි වනාන්තර ප්‍රදේශයි. කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මුළු වනාන්තර වලින් මේ වර්ගයට අයත් ප්‍රමාණය 75 % ක් පමණ වෙයි. සදාහරිත වැසි වනාන්තර වශයෙන් සැලකිය හැකි මේ වනාන්තර අවුරුද්දේ වැඩි කාලයක් වර්ෂාව ලබන අතර කොළ හැලෙන නිශ්චිත කාල සීමාවක් දැකිය නොහැක. විශාල වෘක්ෂයන්ගෙන් යුක්තව ඇති අතර ඉතා වටිනා දැව වර්ග වලින් ද යුක්ත වේ.
- විවෘත වනාන්තර වශයෙන් දක්වා ඇත්තේ මුලින් ඝන වනාන්තර වශයෙන් තිබී පසු කාලයේදී මානව ක්‍රියාකාරකම් මත පරිහානියට ලක්ව තැනින්තැන ගස් කිහිපයක් පමණක් ඉතිරිවී ඇති ඇති වනාත්තරයි. මේවායේ වෘක්ෂලතා ආවරණය 50 % - 75 % පමණවේ. එහෙත් වටිනා දැව වර්ග තවමත් ඉතිරිවී ඇති මෙබඳු කැලෑද ආරක්ෂා කිරිම ඉතා වැදගත්ය. මෙය මුළු වනාන්තර වලින් 10 % ක් පමණ වෙයි.
- ලඳු කැලෑ වශයෙන් දක්වා ඇත්තේ 50 % ට අඩු වන ආවරණයෙන් යුතු මිටි පඳුරු සහිත වන බිමය. මේවා කලින් තිබූ ඝන වනාන්තර හේන් ගොවිතැන් සඳහා කපා විනාශ විමෙන් ඉතිරිවූ ඒවාය. මෙහි ප්‍රතිශතය මුළු වනාන්තර වලින් 13% ක් පමණ වෙයි.

- ඉහත වගුවට අනුව හෙක්ටයාර් 2412.42 ක් ස්වභාවික වනාන්තර ලෙස ඇති අතර එය කොට්ඨාසයේ මුළු භූමියෙන් 14% කි. මුළු භූමියෙන් 86% ක් කෘෂිකාර්මික කටයුතු හා ජලධාරා හා අනෙකුත් පරිහරණයන් සඳහා වෙන්වී ඇති බව මේ අනුව පැහැදිලිවේ. අසීමිත වූත්, තරඟකාරී වූත් මානව අවශ්‍යතා සපුරා ගැනීමට යෑමේදී වනාන්තර මත දැඩි තර්ජනයක් එල්ල වෙමින් පවතී. 2017 ට පෙර පැවති ඉඩම් පරිහරණ දත්ත හා 2017, යාවත්කාලීන ඉඩම් පරිහරණ දත්ත සැසඳීමේදී මෙය වඩාත් පැහැදිලි වනු ඇත. (ප්‍රස්ථාර අංක 08 ).
- එම ප්‍රස්ථාර දත්තයන්ට අනුව ඝන වනාන්තර මෙන්ම විවෘත වනාන්තර යාවත්කාලීන සිතියමට අනුව ප්‍රමාණාත්මකව අඩු වී ඇති අතර වන වගාවන් හා ලඳු කැළෑ යම් ප්‍රමාණයකින් වැඩි වී ඇති බව පැහැදිලිය.
- දැනට ඉතිරිව ඇති ඝන වනාන්තර, විවෘත වනාන්තර සියල්ලම පාහේ සීඝ්‍ර බෑවුම් සහිත කඳු පංති ආශ්‍රිතව විහිදී තිබීම ඒවා ඒ අයුරින් හෝ ඉතිරිව පැවතීමට ඉවහල්වී ඇති බව පෙනේ. අඩවිකන්ද, සූදාගල, ලස්සකන්ද යන ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිත ඝන වනාන්තර සහ විවෘත වනාන්තර විහිදී ඇති අයුරින් ඒ බව තහවුරු වේ.
- මෙයින් පෙනී යන්නේ කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය තුල මෙතෙක් ඉතිරිව පවත්නා ස්වභාවික වෘක්ෂලතා කලාප සුරක්ෂිත කලයුතු බවත්, ඒ සමගම වන වගාවන් තව දුරටත් ස්ථාපිත කළ යුතු බවත්ය. නැතහොත්, ජලධාරා ආශ්‍රිත ජල උල්පත් සිඳියාම, නායයෑම, පාංශු ඛාදනය මගින් භූමි හායනයට ලක් වීම වැනි අහිතකර ප්‍රතිඵල අත්විදීමට සිදුවනු ඇත.

ප්‍රස්ථාර අංක 08 2017, යාවත්කාලීන දත්තයන් හා ඊට පෙර පැවති දත්තයන්ට අනුව වනාන්තර ව්‍යාප්ති තොරතුරු




| | ඝන වනාන්තර | විවෘත වනාන්තර | වනවගා | ලදු බිම් |
|---|---|---|---|---|
| 2017 - දත්ත(හෙක්ටයාර) | 1809.76 | 254.11 | 38.45 | 310.1 |
| 2017 ට පෙර පැවති දත්ත(හෙක්ටයාර) | 2226.91 | 575.9 | 14.8 | 39.05 |


කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්වභාවික වෘක්ෂලතා
N
ඇහැලියගොඩ ප්‍රා.ලේ. කොට්ඨාසය
කෑගල්ල දිස්ත්‍රික්කය
කිරිඇල්ල ප්‍රා.ලේ. කොට්ඨාසය
රත්නපුර ප්‍රා.ලේ. කොට්ඨාසය
සුචිය
ඝන වනාන්තර
විවෘත වනාන්තර
කෘෂි වන වගා
ලදු කැළෑ
ප්‍රා.ලේ.කො.මායිම
0 1,050 2,100 4,200 Meters
145000
150000
155000
160000
165000
185000
180000
175000
170000

## සිතියම් අංක 16: කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැව්ලි සමාගම් සතු වතු වල පිහිටීම


කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වපසරිය තුල වැව්ලි සමාගම් සතු වතු 04 ක් පිහිටා ඇත. එනම්, පුස්සැල්ල වත්ත, ඇහැලියගොඩ වත්ත, ෆාම්ගාඩ්න් වත්ත හා කීරගලවත්ත. පහත සිතියම් අංක 16 හි මෙම වතු වල ව්‍යාප්තිය පෙන්වා දී ඇති අතර එක් එක් වත්තට අයත් කොටස් සම්බන්ධව සිතියමට අනුව ලබා ගත් දත්ත පහත වගු අංක 10 හි පෙන්වා දී ඇත. අදාළ වතු වල මායිම්, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද වැව්ලි සමාගම් සතු ඉඩම් සිතියම් කිරීමේ ව්‍යාපෘතියට අනුව සකසා ඇති අතර එහිදී ක්ෂේත්‍රයේදී ලබා ගත් GPS ඛණ්ඩාංක ඇසුරින් මායිම් සලකුණු කර ඇත.

කොට්ඨාසයේ මුළු භූමිය හා සලකා බැලීමේදී ආසන්න වශයෙන් 10 % කට ආසන්න ප්‍රතිශතයක් වැව්ලි සමාගම් සතු ඉඩම් වශයෙන් භාවිතා වෙයි. භාවිතයට ගත හැකි කෘෂිකාර්මික බිම් සමඟ සලකා බැලීමේදී මෙම වැව්ලි සමාගම් සතු ඉඩම් වල භූමි පරිහරණය කොට්ඨාසයේ ආර්ථිකයට වැඩි බලපෑමක් කළ හැකි ප්‍රමාණයකි. එනම්, මෙම වතු ආර්ථිකයත් සමඟ සැලකියයුතු පිරිසකගෙ දෛනික කටයුතු බද්ධ වී ඇත. වතු ඉඩම් නිසි කළමනාකරණයක් අනුව, ප්‍රශස්ථ ඵලදායීතාවයකින් යුතුව පවත්වා ගැනීම ප්‍රදේශයට සමාජ, ආර්ථික මෙන්ම  පාරිසරික වශයෙන් වැදගත් වන බව මේ අනුව පැහැදිලි වෙයි.

**වගු අංක 10 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වතු වල තොරතුරු**

| වත්තෙ නම | කොටස | ආසන්න වශයෙන් වර්ග ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|
| පුස්සැල්ල වත්ත | ගල්පුස්සැල්ල කොටස | 74.7 |
| | මීගස්තැන්න කොටස | 54 |
| | මියනදෙණිය කොටස | 93.9 |
| | පත්බේරිය කොටස | 64 |
| | පොහොරබාව කොටස | 125.7 |
| | පුස්සැල්ල කොටස | 142 |
| ඇහැලියගොඩ වත්ත | අංක 01 කොටස | 28 |
| | අංක 03 කොටස | 94.8 |
| | අංක 04 කොටස | 57 |
| ෆාම්ගාඩ්න් වත්ත | කොස්ගල කොටස | 89.8 |
| | ඩුහාලෝ කොටස | 50.5 |
| | කරපිංච කොටස | 90.1 |
| | පැරඩයිස් කොටස | 84.5 |
| කීරගල වත්ත | ඩියර්වුඩ් කොටස | 26.6 |
| | පහල කොටස | 170.9 |
| | ඔස්සන්ගොඩ කොටස | 45.6 |
| | ඉහල කොටස | 248.0 |

**සිතියම් අංක 16:** **කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වතු වල පිහිටීම**



## සිතියම් අංක 17 කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පොලිස් බල ප්‍රදේශ

කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ග්‍රාම නිලධාරී වසම් 39 කුරුවිට හා ඇහැලියගොඩ යන පොලිස් බල ප්‍රදේශ දෙකටම අයත් වෙයි. ඒ අනුව ඇහැලියගොඩ පොලිස් බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් වනුයේ තලාවිටිය, අමුහේන්කන්ද, බෝධිමළුව, පත්බේරිය, බටහිර පත්බේරිය, මෙනේරිපිටිය හා පරකඩුවය. ඒවායෙහි රාජකාරී කටයුතු ඇහැලියගොඩ පොලිස් ස්ථානය මගින් සිදු කරනු ලැබේ. සෙසු වසම් 32 හි කුරුවිට පොලිස් බල ප්‍රදේශයට අයත් වන අතර, ඒවායෙහි පොලිස් රාජකාරී කුරුවිට පොලිස් ස්ථානය මගින් ආවරණය කරනු ලැබේ. පහත සිතියම් අංක 17 හි මෙම පොලිස් බල ප්‍රදේශ දෙක පෙන්වා දීඇත.

**සිතියම් අංක 17** කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පොලිස් බල ප්‍රදේශ

